

**අපගේ ජාතියට සහ එහි ජනතාවට සෞභාග්‍යය උදාකරන ගමනක අප නිරත වී සිටින්නෙමු.**

**ඔබත් එහි කොටස්කරුවකු වීමට කැමතිද ?**

**දිවයින පුරා ශාඛා 276 කින් යුත් ජාලයකින් සහ 3000 කට වැඩි ශ්‍රම බලකායකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ සංවර්ධන බැංකුවක් වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩු ඇති පහත තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති ප්‍රතිඵල අභිමුඛ දක්ෂ කාර්යශූර පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ**

## සහකාර කළමනාකාර - නීති

**ප්‍රධාන වගකීම් :**

- පත්කරනු ලබන නීති නිලධාරී, ආයතනික නීතිය පිළිබඳව මනා නිපුණතාවයකින් යුතු වීම සහ සින්ඩිකේට් ණය, ව්‍යාපෘති ණය ඇතුළු සියලුම වර්ගවල ආයතනික ණය වලට අදාළව ලිපි ලේඛන සකස් කිරීමේ හැකියාවකින් යුක්ත වීම.
- පැමිණිලි, දිවුරුම් ප්‍රකාශ සහ පෙත්සම් කෙටුම්පත් කර මූලික අධිකරණය, අභියාචනාධිකරණය හා ශ්‍රේෂ්ඨාධිකරණයද ඇතුළු අධිකරණයන්හි නඩු පැවරීම, සගය ලේඛන ලබා දීම හා අවශ්‍ය අවස්ථාවලදී පරීක්ෂණ/විමසීම් සිදු කිරීම.
- කළමනාකාරීත්වය විසින් යොමු කරනු ලබන කාරණා වලට අදාළව ජ්‍යෙෂ්ඨ උපදේශකයින්, මණ්ඩලයේ නීතිඥවරුන් (Panel Lawyers) සමඟ උපදේශන සාකච්ඡා පැවැත්වීම සහ අවශ්‍ය අවස්ථාවලදී සහය වීම හා මඟපෙන්වීම.
- ගිම්කම් වාර්තා, ලේඛන සහ ප්‍රසම්පාදන කටයුතු වලට අදාළ ගිවිසුම් පිළියෙල කිරීම සහ අනෙකුත් සියලුම නෛතික ලේඛන සකස් කිරීම සහ පරීක්ෂා කිරීම.
- නඩු කටයුතු සහ බැංකුවේ මාණ්ඩලික නීතිඥවරුන් (Panel Lawyers) සම්බන්ධයෙන් තොරතුරු පද්ධතියක් සකස් කර, පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම,
- ගිවිසුම් සකස් කිරීම/ ක්‍රියාත්මක කිරීම/ බලාත්මක කිරීම සහ අනෙකුත් සියලුම නෛතික සහ බැංකු කටයුතු සඳහා ප්‍රධාන නීති නිලධාරීට සහය දැක්වීම.

**මූලික සුදුසුකම් :**

- නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ධුරය දැරීම (නීතිවේදී උපාධියක් සහිතව නම් වඩාත් සුදුසුයි. ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ බැංකු මූල්‍ය අංශයේ වෘත්තීය විභාගවලින් සමත්වීම අමතර සුදුසුකමක් වේ.)

  **සහ**

  සමස්තයක් වශයෙන් සිවිල් නීති අධිකරණ වල සහ රජයේ හෝ පුද්ගලික මූල්‍ය ආයතනයක/ නීතිමය ආයතනයක වසර 02ක පළපුරුද්ද ලබා තිබීම

  සිවිල් අධිකරණ කටයුතු වල මනා පළපුරුද්දක් සහ සින්ඩිකේට් ණය, ව්‍යාපෘති ණය, සංවර්ධන බැංකුකරණය සහ වෙනත් බැංකු සහ මූල්‍යමය කරුණු පිළිබඳ නීතිමය දැක්මක් සහිත පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.
- පරිගණක දැනුම තිබිය යුතු වේ.
- තෝරාගත් අයදුම්කරුවන් භාෂා දෙකෙන්ම නොතාරිස් බලපත්‍ර ලබා තිබිය යුතුයි. (සිංහල සහ ඉංග්‍රීසි )
- **වයස** අවු 40ට අඩු විය යුතුයි.
- මූලිකව වසර 02 කොන්ත්‍රාත් කාලයකට යටත්ව පත් කිරීම සිදු කරනු ලැබේ.

**තෝරාගන්නා ක්‍රමවේදය :**

අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව අයදුම්කරුවන් තෝරාගෙන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**වැටුප් :**

තෝරාගන්නා ලද අයදුම්කරුට ආකර්ෂණීය වැටුප් පරිමාවක් පිළිබඳ සාකච්ඡා කර තීරණයකට එළඹීමට යෝජනා කළ හැකිය.

**අයදුම් කළ යුතු ආකාරය :**

අධ්‍යාපනික සුදුසුකම් , වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද ඇතුළත් සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාව ඥාති නොවන නිර්දේශකවරුන් දෙදෙනෙකුගේ දුරකථන අංක සහිත තොරතුරු ඇතුළත් කර මෙම දැන්වීමේ දින සිට දින 07ක් ඇතුළත careers@rdb.lk යන E-mail ලිපිනයට යොමු කළ යුතුය. අයදුම්කිරීමේදී විෂය තීරයේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතු වේ. ඔබ විසින් යොමු කරනු ලබන තොරතුරු වල රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ. අධ්‍යාපනික සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද තහවුරු කරන සියලුම සහතික පත්‍ර සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂා කරනු ඇත.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී,**
**මානව සම්පත් සංවර්ධන හා පරිපාලන,**
**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව.**